# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2090/12 - 2018 සැප්තැම්බර් මස 25 වැනි අඟහරුවාදා - 2018.09.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### (262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ නුවරගම් පළාත නැගෙනහිර ප්‍රාදේශීය සභාවේ සභික ධූරයේ පුරප්පාඩුවක් පිරවීම

මිය යාම හේතුකොට ගෙන නුවරගම් පළාත නැගෙනහිර ප්‍රාදේශීය සභාවේ සභික ධූරයක් පුරප්පාඩු වී ඇති හෙයින්ද ;

ඉහත කී ආඥාපනතේ 66අ (1) (අ) වගන්තිය යටතේ නුවරගම් පළාත නැගෙනහිර ප්‍රාදේශීය සභාවේ අංක 4- විජයපුර කොට්ඨාසයට තේරී පත් වූ රණවීර ආරච්චිලාගේ ප්‍රදිප් නිලවීර අයත් වන්නා වූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූද, එම පක්ෂයට අයත් වන්නාවූ ද, එම නුවරගම් පළාත නැගෙනහිර ප්‍රාදේශීය සභාවේ අංක 4 - විජයපුර කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින්ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා බස්නායක අධිකාරම් ගුණරත්න මුදියන්සේලාගේ කුමුදුනි ගීතමාලා ගුණරත්න කුමාරි නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින්ද;

නුවරගම් පළාත නැගෙනහිර ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි මුහෙයියදීන් බාවා මුහම්මදු සුෆ්යාන් වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ (262 අධිකාරය) 66අ(1)(අ) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් බස්නායක අධිකාරම් ගුණරත්න මුදියන්සේලාගේ කුමුදුනි ගීතමාලා ගුණරත්න කුමාරි, නුවරගම් පළාත නැගෙනහිර ප්‍රාදේශීය සභාවේ අංක 4 - විජයපුර කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

එම්.බී.එම්.සුෆ්යාන්,<br>
තේරීම්භාර නිලධාරී,<br>
නුවරගම් පළාත නැගෙනහිර ප්‍රාදේශීය සභාව.

2018 සැප්තැම්බර් මස 25 වැනි දින,<br>
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,<br>
අනුරාධපුර.

10-284


1A - G 28591 - 17 (2018/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.